“බංකොලොත්කරු කවුරුන්දැයි ඔබ දන්නෙහු ද?”

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “බංකොලොත්කරු කවුරුන්දැයි ඔබ දන්නෙහු ද?” යැයි එතුමාණෝ විමසූහ. ඔවුහු ‘අප අතර බංකොලොත්කරු වන්නේ තමන්ට දිර්හම් හෝ වස්තුව හෝ නොමැති අය වේ’ යැයි පැවසූහ. එවිට එතුමාණෝ: “සැබැවින්ම මාගේ සමූහයා අතර බංකොලොත්කරු වන්නේ, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ සලාතය, උපවාසය හා සකාත් යන වගකීම් සමග පැමිණිය ද ඒ සමගම ඔහු කෙනෙකුට දොස් නඟා, මොහු ගැන අවලාද නගා, මොහුගේ ධනය සූරා කා, මොහුගේ රුධිරය හලා, මොහුට පහර දී පැමිණෙන පුද්ගලයා ය. එවිට ඔහුගේ කුසල් කර්ම ඒ අයට පිරිනමනු ලැබේ. එය ඔහුගේ යහකම් වෙති. මොහුට තීන්දු දීමට පෙර ඔහුගේ කුසල් අවසන් වූ විට මොවුන්ගේ වැරදි ගෙන ඔහු වෙත හෙළනු ලැබේ. පසුව ඔහු අපා ගින්නට විසි කරනු ලැබේ.”
[صحيح] [رواه مسلم]

“බංකොලොත්කරු කවුරුන්දැයි ඔබ දන්නෙහු ද?” යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ විමසූහ. ඔවුහු ‘අප අතර බංකොලොත්කරු වන්නේ දිර්හම් හෝ වස්තුව නොමැති අය වේ’ යැයි පැවසූහ. එවිට එතුමාණෝ: “මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ සැබැවින්ම මාගේ සමූහයා අතර බංකොලොත්කරු වන්නේ කෙනෙක් සලාතය, උපවාසය හා සකාත් වැනි යහ ක්රියාවන් සමග පැමිණිය ද ඒ සමගම ඔහු කෙනෙකුට දොස් නඟා බැන වැද, ඔහුගේ මාන්ය කෙළෙසන පරිදි ඔහු ගැන අවලාද නගා, ඔහුගේ ධනය සූරා කා පැහැර ගෙන, ඔහුගේ රුධිරය හළා ඔහුට අපරාධ කර, ඔහුට පහර දී අවමානයට පත් කර තත්ත්වයේ පැමිණෙන පුද්ගලයා ය. එවිට අපරාධ කළ තැනැත්තාගේ යහපත ගෙන අගතියට පත් වූ තැනැත්තාට පිරිනමනු ලැබේ. මොහුට තීන්දු දීමට පෙර ඔහුගේ යහපත අවසන් වූ විට අගතියට පත් වූ අයගේ වැරදි ගෙන අපරාධකරුගේ වාර්තාව තුළට ඇතුළත් කරනු ලැබේ. පසුව ඔහුට යහකම් නැති වූ තත්ත්වයේ ඔහු අපා ගින්නට විසි කරනු ලැබේ.

http://sunnah.global/hadeeth/si/show/6454